# දේශීය පෝර භාවිතය සහ සැපයුම

ප්‍රවෘත්ති ප්‍රකාශන නිලධාරී
කේ. තිලේනාදන් විසිනි.

ලොව සියළු ජාතීන්ගේ පොදු හතුරෙක් ලෙස සැලකෙනුයේ බඩගින්නයි. ආදියේ පටන්ම බඩගින්න අඩු කිරීමට හෝ නැති කිරීමට මිනිස් ජාතිය විසින් මහත් සටන් කර ඇත. වත්මන් ලොවෙහි දියුණු වෙන ජාතීන්ට අයිති අප වැනි රටක පස, ජනතාව, ස්වභාවික සම්පත් මෙන්ම විද්‍යාත්මක නිපුනතාවයන්ද නිසි ලෙස ප්‍රයෝජනයට ගන්නේ නම් නම් බඩගිනි තර්ජනය තුරන් කරලීමට අපටද හැකි වනු ඇත.

කෘෂිකාර්මික සංවර්ධනය අප ඉදිරියේ ඇති ප්‍රශ්න රාශියකටම එකම පිළිතුරුව ඇත. කෘෂි කර්මය පසෙහි තත්වය, දේශගුණය, ජල පහසුව මෙන්ම ජනතාවගේ උනන්දුව හා නිපුනතාවය වැනි කරුණු රාශියක් මත රඳා පවතින්නකි. මේ සියළුම සාධකයන් ඉතා හොඳින් තිබුනද බෝගයන් නැතිනම් සතුන් විසින් පොලවෙන් ලබා ගන්නා පෝෂ්‍ය පදර්ථයන් ආපසු පොලවට නොලැබෙන්නේ නම් වගාවන් සාර්ථක නොවනු ඇත. මේ මැයින් බලනවිට පොලව අපට, අප බැංකු ගිණුමකට සම කළ හැකිය. බැංකු ගිණුමෙන් ලබා ගන්නා මුදල් වෙනුවට ආපසු තැන්පතු නොදමා අපට යලි යලි මුදල් ගැනීම අපහසු වනු ඇත.

## ගොවිපල පෝර

තම වගාවන් සඳහා ගොවිපල පෝර යොදා ගැනීමේ අගය අප ගොවි මහතුන්ට අමුතුවෙන් කිව යුතු නොවේ. දෙවන ලෝක යුද්ධය අවසන් වන තුරුම අප ගොවීහු කෘතිම පොහොර භාවිතයක් නොකළහ. වැඩි අස්වනු වී හා වෙනත් බෝගයන් හඳුන්වා දෙනු ලැබූ පසුගිය දශකයන් දෙක තුළය අප ජනතාවද කෘතිම රසායනික පොහොර භාවිතයට හුරු වූයේ සම්ප්‍රදයිකව ගොවි මහතුන් වයදූ පෝර විද්‍යාත්මක දැනුමක් අනුව කළ ඒවා නොවේ. මේ පිළිබඳව විද්‍යාඥයින් පවසන්නේ කුමක්දැයි අපි දැන් බලමු.

1. කොළ හා සත්ව පොහොර පසට කාබනික ද්‍රව්‍ය කෙළින්ම එක් කරයි.

2. අළුවල පොටෑෂ් 5%–25% දක්වා ප්‍රමාණයක් අඩංගු වේ. අතු රිකිලි පිළිස්සූ විට පොටෑසියම් වැඩි ප්‍රමාණයක් ලබා ගත හැකිය.



මේ දඹදෙණිය ආසනයේ මනාව වැවූ, මැත වින් පෝර යෙදූ පොල් වගාවකි. පළාත පොල් වලම ප්‍රසිද්ධ වූවත් වැඩි දෙනකු පොල් ඉබේ හැදෙන බෝගයක් ලෙස සැලකීමට පුරුදු වීම හිතකර නොවේ. අන් බෝග වලට මෙන්ම පොල් වලට ද පෝර අවශ්‍යමය. සහනාධාර ක්‍රම යටතේ ලැබෙන පෝරවත් පොල් වගාවන්ට නොයෙදීම අනාගතයට අසුබ ලකුණක් බවට සැක නැත.

3. වෙරළාසන්නව ලැබෙන වල් පැලෑටි පසට පොටෑෂ් එක් කිරීමට කදිමය.

4. කාබනික පෝර දුර්වල ජලවහනය ඇති පසට එක් කිරීමෙන් එහි යකඩ ප්‍රමාණයන් වැඩි කළ හැක.

5. ගොවිපල පෝර පසෙහි මැන්ගනීස් දුර්වලතාවයන් නැති කිරීමට උපකාරී වේ. ගොවිපල පෝර තීයැදියක නයිට්‍රජන් 0·6% ක්ද, පොස්පරස් 0·25% ක්ද, පොටෑෂ් 0·5% බැගින්ද අඩංගු වේ.

6. රනිල බෝග පොළවට අවශ්‍ය නයිට්‍රජන් ලබා දීමෙන් පස සරු කරයි.

මෙම කරුණු අප සම්ප්‍රදායික වගා ක්‍රමවල මහිමය මොනවට පෙන්වයි. එහෙත් මේවා වැඩි දියුණු කිරීමට බොහෝ ඉඩ ඇත. උදා: ලෙසින් ගොවිපල පොහොර දැක්විය හැකිය. මෙම පෝර බෝගයන්ට ඉතා හොඳ වුවද එය අංග සම්පූර්ණ පොහොරක් නොවේ. ගොවිපල පෝරවල ගුණාත්මක අගය සතුන්ගේ වයස, ආහාර ද්‍රව්‍ය යන කරුණු අනුව වෙනස් වේ. මෙ නිසා පොස්පරස් හා පොටෑසියම් යෙදීමෙන් ගොවිපල පොහොර අංග සම්පූර්ණ කර ගැනීම නිර්දේශ කෙරේ.

## මූලික ප්‍රශ්ණ

රසායනික පෝර මෙන් අවශ්‍ය මූලික ද්‍රව්‍ය නිසි ප්‍රමාණයෙන් නැති නිසා ගොවිපල පෝර විශාල ප්‍රමාණයන්ගෙන් යෙදිය යුතු වේ. මෙ නිසාවෙන්ම මුහුණ දීමට ඇති මූලික ප්‍රශ්නයන් තුනක් වේ.

1. පෝර නිපදවීමෙ හා යෙදීමෙ කාලය තුළ අපතේ යෑම අඩු කර ගැනීම;
2. පෝර අවශ්‍යම වේලාවන්හිදී නිසි අයුරින් යොදා නාස්තිය වැළකීම;
3. වැඩිම පලදාවක් දෙන බෝගයන්ට මෙම යෙදීම.

**දේශීය පසුබිම:** අප පෝර අවශ්‍යතාවයන් බැඩි හරියක්ම විදේශ වලින් ගෙන්වනු ලැබේ. සපුගස්කන්ද යූරියා නිෂ්පාදන කම්හල වැඩ පටන් ගන්නා තුරු මේ තත්වයේ වෙනසක් සිදු නොවනු ඇත. දැනට මෙරටට අවශ්‍ය පෝර ගෙන්වනු ලබන්නේ පෝර සංස්ථාව මගනි. ඇමෝනියම් සල්ෆේට හා ට්‍රපල් සුපර් පොස්-ෆේට යන ද්‍රව්‍යයන් වැඩිපුරම ගෙන්වනු ලබයි.

ගිය වසරේ සංස්ථාව මගින් පෝර ටොන් දස ලක්ෂයක් ගෙන්වූ අතර මේ වසර සඳහා රුපියල් දස ලක්ෂ 82 ක් වටිනා මෙට්‍රික් ටොන් 4, 42, 000 ක් ඇණවුම් කොට තිබේ. මීන් වැඩි ප්‍රමා-ණයක් දැනටම ගෙන්වා ඇති අතර එන වසර සඳහා මීටත් වැඩි ප්‍රමාණයක් ගෙන්වීමට සිදු වනු ඇත. මෙම පෝරවලින් වැවිලි බෝග සඳහා වන පෝර ප්‍රමාණය වරායේදීම වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයට පෝර සපයන පෞද්ගලික සමාගම් වෙත පවරනු ලැබේ. තේ, රබර්, පොල්, සුළු අපනයන බෝග හා පළතුරු සඳහා මේ මගින් පෝර සැපයේ.

**වැලි වැනි අපද්‍රව්‍ය පෝරට මිශ්‍ර කිරීම ජයටම සිදුවන්නකි. පිට පළාත්වලට යා යුතු පෝර කොළඹදීම කළු කඩයට ඇදෙයි. බාල පෝර ජාවාරම නැවැත්වීමට කල් පසු වූවා වැඩි කරම.**

වී වගාවට අවශ්‍ය පෝර තනිකරම සප-යන්නේ පෝර සංස්ථාවයි. මෙම මිශ්‍ර හා මූලික පෝර ගොවිජනසේවා මධ්‍යස්ථාන, සමූපකාර හා ලියා පදිංචි තොග වෙළඳුන් 490 ක් මගින් අලෙවි කරනු ලැබේ. මෙම වෙළඳුන්ගෙන් ක්‍රියාත්මකව ඇත්තේ 150 ක් බවද සංස්ථාව පවසයි. පෝර ටොන් එකකට රු. 130/- ක කොමිස් මුදලක් ඔවුනට ලැබේ.

සමූපකාර මගින්, වී. පොල්, එළවළු හා වෙනත් බෝග සඳහා වන පෝර අලෙවි කළද, ඔවුන්ගේ මුදල් තත්වය අනුව තොග ගැනීමේ ප්‍රමාණයන් තීරණය වේ. මෙය සමූපකාර අලෙවි ක්‍රමයේ එක් බාධකයකි. එහෙත් මෙවර ගොවී මහතුන්ගේ 'මැසිවිලි එල්ලව ඇත්තේ අධික මිළ කෙරෙහිය. මේ නිසාවෙන් වගා වන් සඳහා යොදන පෝර ප්‍රමාණය අඩු කිරිමට ගොවියන් පෙළඹෙන බවක් දක්නට ඇත. මේ තත්වය යටතේ වුවද උඩරට එළවළු වගා කරන්නන් නිර්දේශිත ප්‍රමාණයටත් වඩා පෝර යොදන බවද හෙළිව තිබේ.

වෙළෙන්දන් විසින් සංස්ථා පෝර නීති විරෝධි ලෙස මිශ්‍ර කිරිම පෝර වෙළදාමේ තවත් ප්‍රශ්නයක්ව ඇත. සංස්ථාවට ලැබෙන පැමිණිලි ගැන වහා පරීක්ෂා කර දඬුවම් දුන්නද, පෝර වැලි වැනි ද්‍රව්‍ය මිශ්‍ර කර බාල කිරිම දිග-ටම කෙරෙන බව ගොවී මහතුන්ගේ අත්දැකීම වී ඇත තොග වෙළෙඳුන්ට පෝර සැපයෙනුයේ හුණුපිටිය ගබඩාවෙනි. වගා රටාව අනුව වැඩි ඉල්ලුමක් ඇති පෝර පිට පළාත්වලට ගෙන යන්නේ නැතිව කොළඹදීම වැඩි මුදලකට කළු කඩයට විකිණීමද සිදු වේ. බල කිරිම කොට වැඩිපුර විකිණෙන්නේ මෙවැනි පෝරය.

නොවැම්බර් මස වැඩ ඇරඹෙන පෝර සංස්ථාවේ මාහෝ ප්‍රාදේශික ගබඩා හා මිශ්‍රණ සංකීර්ණය මෙම ජාවාරම වැලකීමේ මූලික පියවර වනු ඇත. දිවයිනේ දිස්ත්‍රික්ක විසිහතරම අයත් වන පරිදි තවත් මෙවැනි සංකීර්ණ හතරක් ඉදිවනු ඇත. එකක ගබඩා හැකියාව ටොන්

50,000 කි. මාහෝ සංකීර්ණය උතුරු උතුරු මැද හා වයඹ පළාත්වල පෝර අවශ්‍යතාවයන් සපයනු ඇත.

## පෝර ගබඩා කිරීම

වෙළෙන්දන් මෙන්ම ගොවි මහතුන්ද පෝර ගබඩා කිරීම කෙරේ එතරම් සැළකිල්ලක්දක්වනු දකින්නට නැත. මෙහිලා මතු දැක්වෙන කරුණු සැළකිල්ලට ගත යුතුය.

1. පෝර ගබඩා හෝ කාමර වියලි ඒවා විය යුතුය. පෝර ගෝනි ලෑලි හෝ ලී කොට වැනිදෙයක් මත මිස නිකම්ම පොළොව මතත නොබන්න.
2. පෝර ගෝනි ලංවන සේ ගබඩා කරන්න. එවිට වාතයේ තෙතමනය ඇදගැනීම අඩුවේ.
3. එක ගබඩා තට්ටුවකට ගෝනි හත අටකට වඩා නොදමන්න. මීට වඩා වැඩි වුවහොත් යට ඇති ගෝනි මතට එන බර නිසා පෝර සණවීම සිදුවිය හැක.
4. අරිනු ලැබූ මෙන්ම කැඩුණු ගෝනිද වෙනම ගබඩා කරන්න. ඒවාට ඇද ගනු ලබන තෙතමන ප්‍රමාණය අධික වේ.

## ගොවි ප්‍රශ්ණ

● අම්පාර ගොවි මහතුන් උක් සඳහා නිර්දේශිත පෝරද වී වගාවට යොදනු ලබයි.

● පෝර සංස්ථාව වී ගොවිතැන සඳහා වී. 1 නම් මිශ්‍ර පෝරක් අලෙවි කරයි. මෙය භාවිතා කිරීම අඩු වී ගෙන යයි. ගොවි මහතුන් කියනුයේ වී. 1 පෝරින් වල් බෝවීම ඉක්මන් වන බවය.

● සාමාන්‍යයෙන් පෝර තිබුණද ඇතැම් පෝර අවශ්‍ය වෙලාවන්හිදී ගන්නට නැත. සැපයීමට සුළු පමාවක් වූ විට පවා ගොවි මහත්වරු එම පෝර නොදමති. මෙය වෙළඳුන්ට මුහුණ දීමට ඇති ප්‍රශ්නයකි.

● හුණුපිටිය පෝර බෙද හැරීමේ ඒකකයේ කටයුතු වඩාත් ඉක්මන් සේවාවක් ලැබෙන පරිද්දෙන් විධිමත් කළ යුතුය.

● ගොවිපල පෝර මිළද ඉහළ ගොස් ඇත. කඳපොල ගොවිපල පෝර ලොරියක් රු. 450/- ක්ද, බණ්ඩාරවෙල රු. 325/- ක් හා යාපනයේ රු. 700/- ක්ද වේ.

● ගොවි මහතුන් ගොවිපල පෝර හා කොම්පෝස්ට් පෝර නොසළකා හැර කෘත්‍රිම පෝරම වගාවන්ට යොදනු දක්නට ලැබේ. තම ගෙවත්තෙන්ම ලැබෙන පෝර සමහරු ගෙවතුවලට යොදනුයේද ඉදහිටය.

● තම පෙදෙස්වලට පෝර නිර්දේශ කිරීමට පෙර පස් පරීක්‍ෂා කොට එසේ කළයුතු බව ගොවි මහතුන්ගේ මතය වී ඇත. දිස්ත්‍රික්ක පස් පරීක්‍ෂා කිරීමේ ඒකක පිහිටුවිය නොහැකි නම් ජංගම ඒකකවත් පිහිටුවිය යුතුය.

● පෝර මිශ්‍රණ සකස් කරනුයේ විද්‍යාත්මක පරීක්‍ෂණ හා නිර්දේශ අනුවය.

● දනට කෙරෙන අයුරින් දිගටම තම ඉඩම් වලට පෝර, වල් නාශක හා කෘමි නාශක යෙදුවොත් අනාගතයේ පසෙහි තත්වය කුමක් වේදැයි සැකයක් දනුමැති ගොවි මහතුන් තුළ පහළ වී තිබේ.

## සංස්ථාව දෙන සහන

1. පෝර ටොන් එකක් ගෙන යෑම හා ගබඩා කිරීම සඳහා රු. 45/- ක අඩු කිරීමක්;
2. දුර ප්‍රමාණය අනුව රු. 15/- සිට රු.130/- දක්වා වන ප්‍රවාහන ගාස්තු අඩු කිරීමක්;
3. බැංකු සහතිකයක් මත තුන් මසක පෝර සැපයුමක්;
4. අත්පිට මුදලට මිළට ගැණුම සඳහා 2% ක වට්ටමක්.

මෙම සහන යටතේ ටොන් එකකට රු. 130/- ක අඩුකිරීමක් පෞද්ගලික වෙළඳුන්ට ලැබේ. ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා ටොන් එකකට රු. 140/- ක අඩුකිරීමක් ලැබේ.

ක්‍රියාත්මක නොවන තොග වෙළඳුන් වෙනුවට වෙනත් ඒජන්ත වරුන් පත් කළයුතු බව අපට මුණ ගැසුණු ගොවි මහතුන්ගේ වැදගත් ඉල්ලීමක් විය.

පෝර සංස්ථාවෙන් පෝර ලබා ගැනීමේදී කොල්ලුපිටියේ ප්‍රධාන කාර්යාලයට මුදල් ගෙවා හුණුපිටියට ගොස් පෝර ලබා ගත යුතුව ඇත. සමහරවිට මුදල් ගෙවූ පෝර වර්ග ගබඩාවේ නොමැති බව හුණුපිටියෙන් පැවසීම, ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමුපකාර මෙන්ම වෙළඳ මහතුන්ද මුහුණපාන මහත් දුෂ්කරතාවයක්ව තිබේ. ප්‍රධාන කාර්යාලය හා හුණුපිටියත් අතර කටයුතු දනට වඩා සම්බන්ධතාවයකින් ගැණුම් කරුවන්ට පහසු වන අයුරින් කළයුතු බව ඔවුන්ගේ අදහසව ඇත.

සමහරවිට සිකුරාද දිනක පෝර ගන්නාවිට එක් පෝරක් එදම දී ඉතිරිය ගැනීමට ඊළඟ සඳුදට එන ලෙස හුණුපිටියෙන් දන්වීම මොනම වෙළඳ පිළිවෙතකටවත් නොගැලපෙන්නක් බව වෙළඳ මහත්වරු පවසති. මේ නිසාවෙන් වන අනවශ්‍ය වියදම් හා පමාවන් නිසා වගා සැලැස්මවල්ද අඩපණ වේ.